# <u>ගරු අග්‍රාමාත්‍ය තුමන්ගේ පණිවුඩය</u>



ජනාවාස සංවර්ධනය යනු රටක ප්‍රධානතම සංවර්ධන අවශ්‍යතාවයක් ඉෂ්ඨ කිරීමකි .එමගින් යහපත් සමාජයක් ගොඩනැගීමට අවශ්‍ය ජනතාවට ඵලදායි ජීවිතයක් සඳහා වූ මූලික නිවසක හිමිකම ලබාදීම සිදුකරයි . ඒ අනුව ජනාවාස ගැටළුවට විසඳුම් සෙවීම යනු රටක් වශයෙන් මුහුණ පා සිටින බොහෝ අභියෝග ජයගැනීමකි .

එක්සත් ජාතින්ගේ සංවිධානය වාර්ෂිකව ජගත් ජනාවාස දිනය සැමරීම තුළින් උත්සාහ ගන්නේ මුළු ලොවම මුහුණ පා සිටින කිසියම් ජනාවාස ක්‍රියාදාමයක් කෙරෙහි ජගත් ප්‍රජාවගේ අවධානය යොමුකොට ඒ තුළින් වඩාත් ඵලදායි ප්‍රතිඵල ලබාගැනීමයි .

මෙවර ජනාවාස දින තේමාව වඩාත් කාලෝචිතවුත් , අර්ථාන්විතවුත් වදනකි. "**සහජීවන නගර**" නමින් එය නම්කොට ඇති අතර, විවිධවූ ක්‍රියාකාරකම් තුළින් නගරය තුළ ගොඩනැගෙන සහජීවනය,රටක ප්‍රධානම සංවර්ධන කේන්ද්‍රය වන නගරයේ පමණක් නොව සමස්ථ දේශයටම සහජීවනය ළඟාකිරීමකි .

වත්මන් රජය විසින් ගමත් නගරයත් ඒකාබද්ධකොට ක්‍රියාවට නංවා ඇති සමාජීය හා ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළින් උත්සාහ ගන්නේ සෑම සියළු ක්ෂේත්‍රයක් තුළින්ම සහජීවනය ගොඩනැගීමයි . එය වඩාත් සවිමත් කිරීමට මෙවර ජනාවාස දිනය නිමිත්තෙන් ක්‍රියාවට නැංවෙන සහජීවන නාගරීකරණ ක්‍රියාදාමය තුළින් උත්සාහ ගතයුතුවේ . නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය සහ නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශය ඒකාබද්ධව විවිධ ආයතන දායකත්වයෙන් ගනු ලබන ප්‍රයත්නය මෙම ක්‍රියාදාමය ශක්තිමත් කිරීමට හේතුවක් වන බව මම විශ්වාස කරමි .

**රත්නසිරි වික්‍රමනායක**
**අග්‍රාමාත්‍ය**